# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

**11 ශ්‍රේණිය** | **ඉතිහාසය - II**

නම/ විභාග අංකයෘ ........................................ කාලය පැය 2යි

**I කොටසින් 1 ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**II කොටසින් ප්‍රශ්න 4කට ද III කොටසින් 1එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.**
**පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන 06කි.**

---

01)

(අ) පහත I යටතේ දී ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලංකා සිතියමේ II යටතේ දක්වා ඇති ස්ථාන සියල්ල ලෝක සිතියමේ ද ලකුණු කර නම් කරන්න.

I. නච්චදූව වැව/ පේදුරු තුඩුව/ පල්ලවංක/ පොම්පරිප්පු/ සලාවත්තොට/ සෙංකඩගල/ බුන්දල/ යටිගල්පොත්ත/ පොතාන/ නල්ලූර්/ සූකරතිත්ථ / කලා ඔය

(ලකුණු 12)

II. මලය අර්ධද්වීපය/ ජපන් දූපත්/ කළු මුහුද/ රෝමය/ මධුරාසිය/ පර්සියන් බොක්ක

(ලකුණු 6)

(ආ) පහත A සිට D දක්වා දී ඇති ඓතිහාසික තොරතුරු සම්බන්ධයෙන් අදාල පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

A- අනුරාධපුර රාජධානිය පාලනය කළ අවසාන පාලකයාගේ නම ලියන්න.
B- ඉබ්බන්කටුවෙන් සොයා ගත් පබළු මාලයට පබළු ආනයනය කළ රට නම් කරන්න.
C- ලංකාවේ පළමු තේ පැළය රෝපණය කළ ස්ථානය නම් කරන්න.
D- ඉන්දියාවට පළමුවරට ගොඩ බට ඉංග්‍රීසි ජාතිකයා නම් කරන්න.

(ලකුණු 4)

(ඇ) A රූපය



1) මෙම රූපයෙන් දක්වෙන නිර්මාණයේ නම ලියන්න.
2) එය අයත් රාජධානි යුගය නම් කරන්න.
3) මෙම නිර්මාණය ඉදිකර ඇති ගංගාව නම් කරන්න.
4) මෙම නිර්මාණය තුළින් අතීත ලංකාවේ කුමන තාක්ෂණික දැනුමක් පිළිබඳව තොරතුරු හෙලිවේද ලියා දක්වන්න.

(ලකුණු 4)

B රූපය



1) මෙම පින්තූරයෙන් දක්වෙන නායකයා නම් කරන්න.
2) එතුමාගේ මූලිකත්වයෙන් ආරම්භ වූ දේශපාලන පක්ෂය නම් කරන්න.
3) මෙතුමා සම්බන්ධ වී බ්‍රිතාන්‍යයන්ට එරෙහිව ලංකාවේ ගෙන ගිය අරමුදල් රැස්කිරීමේ ව්‍යාපාරය හැඳින්වූ නම ලියන්න.
4) එයින් රැස්කරගත් මුදල් වැය කරන ලද කාර්යයක් නම් කරන්න.

(ලකුණු 4)

## II කොටස

02)

i. ලංකාව පිළිබඳව තොරතුරු හෙළිවන දකුණු ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ල 3)

ii. මහාවංශය වඩාත් ම විශ්වසනීය සාහිත්‍ය මූලාශ්‍රය ලෙස ලංකාවේ කීර්තියට පත්වීමට බලපෑ හේතු දෙකක් ලියන්න. (ල 4)

iii. ලංකාවේ පුරාවස්තු විනාශවන හේතු දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. ඉතිහාසය හැදෑරීම වැදගත්වන හේතු තුනක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 6)

03)

i. පහත සඳහන් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු අදළ අංක පිළිවෙළින් සපයන්න. (ල 3)

A- ලංකාවේ පළමු රජ ලෙස අනුරාධපුරය ගොඩනැගු රජතුමාගේ නම ලියන්න.

B- කෝට්ටේ බලකොටුව නිර්මාණය කළ තැනැත්තා නම් කරන්න.

C- වල්ලිපුරම් රන්පත කරවූ අවධියේ ලංකාව පාලනය කළ රජතුමා නම් කරන්න.

ii. රජතුමා ජනතාව ඉදිරියේ පෙනී සිටි ආකාරය හඟවමින් අතීත ලංකාවේ භාවිතා වූ රාජ්‍යත්ව සංකල්ප දෙකක් හා එම සංකල්ප වලින් පෙනී සිටි රජවරුන් සඳහා උදහරණ එක බැගින් ලියා දක්වන්න. (ල 4)

iii. වසභ රජතුමාගේ ආර්ථික සේවාවක් හා දේශපාලන සේවාවක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. දෙවන පැතිස් රජතුමා දූරදර්ශී නායකයෙකු ලෙස දේශීය හා විදේශීය රාජතාන්ත්‍රික සබඳතා ගොඩනගා ගත් අයුරු (දේශීය උදහරණ 2ක් සහ විදේශීය උදහරණ 1ක්) ලෙස උදහරණ 3ක් ඇසුරෙන් විස්තර කරන්න. (ල 6)

04)

i. පැරණි සමාජයේ "කුඩින්" යන සමාජ ස්ථරය නියෝජනය කළ වෘත්තිකයින් පිරිස් තුනක් නම් කරන්න. (ල 3)

ii. පහත සඳහන් නීති මගින් විස්තර කෙරෙන කාර්යයන් ලියා දක්වන්න. (ල 4)

a- මාඝාත නීතිය

b- ගෘහ දණ්ඩ බද්ද

iii. ලංකාවේ පැරණි සමාජය තුළ විවිධ වර්ගයේ ආහාර පිසිමින් විවිධ රසයන් ගුණයන් සහිත ආහාර අනුභවයට අපේ පැරැන්නන් හුරු වී සිටියහ. උදහරණ දෙකක් දක්වමින් ඉහත කරුණ විස්තර කරන්න. (ල 5)

iv. මෙරට අතීත සමාජයේ විසූ කාන්තාවන් සමාජ සුරක්ෂිතතාව, දේශපාලන නිදහස හා දේපල අයිතිය භුක්ති විඳි බව එක් කරුණකට එක් උදහරණයක් බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ල 6)

05)

i. විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය බෙදුණු කොටස් තුන නම් කරන්න. (ල 3)

ii. කෝට්ටෙ රාජධානියේ දේශපාලන කටයුතු උදෙසා පෘතුගීසීන් සම්බන්ධ කර ගැනීමට හේතු වූ VII වන බුවනෙකබාහු රජුගේ ක්‍රියාකලාපයන් දෙකක් ලියන්න. (ල 4)

iii. යාපන රාජ්‍යය පහසුවෙන් පෘතුගීසි ග්‍රහණයට පත්වීමට බලපෑ හේතු දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. කෝට්ටේ රාජධානිය බිඳ වැටීමට දොන් ජුවන් ධර්මපාල රජුගේ ක්‍රියාමාර්ග හේතු වූ අයුරු කරුණු 3ක් ඇසුරින් විස්තර කරන්න. (ල 6)

06)

i. ලංකාවේ ක්‍රියාත්මක වූ මිෂනාරි සංවිධාන තුනක් නම් කරන්න. (ල 3)

ii. ලංකාවේ බෞද්ධ ආගමික පුනරුදය උදෙසා ඕල්කට් තුමා ගත් ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ල 4)

iii. ලංකාවේ කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට මිෂනාරීන් ගත් ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. බෞද්ධ ආගමික පුනරුදය තුළ මෙරට බෞද්ධ නායකයින් බුදුදහම රැක ගැනීමට ගත් ක්‍රියාමාර්ග තුනක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 6)

07)

i. මෙරටට හඳුන්වා දුන් මුල් කාලයේ ම අසාර්ථක වීම නිසා වගාවෙන් ඉවත් වූ වැවිලි භෝග වර්ග තුනක් නම් කරන්න. (ල 3)

ii. වැවිලි කර්මාන්තයේ උන්නතියට බලපෑ කෝල්බෘක් යෝජනා දෙකක් ලියන්න. (ල 4)

iii. බ්‍රිතාන්‍ය පාලනය නිසා ලංකාවට උරුම වූ ප්‍රයෝජනවත් අංග දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 5)

iv. ලංකාවේ සාම්ප්‍රදයික ගුණගරුක සමාජ ක්‍රමය බිඳ දැමීමට බ්‍රිතාන්‍ය සංස්කෘතිකාංග මෙරට සංස්කෘතියට එක් වීම හේතු විය. උදහරණ තුනක් දක්වමින් විස්තර කරන්න. (ල 6)

## III **කොටස**

08)

i. පුනරුද යුගයේ චිත්‍ර කලාව තුළ ජනප්‍රිය වූ චිත්‍ර ශිල්පීන් තිදෙනෙක් නම් කරන්න. (ල 3)

ii. මානව වාදය යනු කුමක්ද? කෙටියෙන් හඳුන්වන්න. (ල 4)

iii. යුරෝපයේ ඇති වූ පුනරුදය දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රවලට බලපෑම් කරමින් යුරෝපා රටවල් සංවර්ධනය කරා ගෙන ගිය අයුරු එක් ක්ෂේත්‍රයකට එක් උදහරණය බැගින් සපයමින් විස්තර කරන්න. (ල 5)

iv. යුරෝපය තුළ ඇති වූ පුනරුදය ලංකාව කෙරෙහි ඇති කළ බලපෑම දේශපාලන, ආර්ථික හා සංස්කෘතික යන අංශ යටතේ උදහරණ එක බැගින් දෙමින් විස්තර කරන්න. (ල 6)

09)

i. කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන්ම ඇතිවීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ල 3)

ii. ගොඩබිම් ප්‍රවාහනය දියුණු කිරීමට කාර්මික විප්ලවය තුළ බිහිවූ නිර්මාණ තුනක් හා ජල ප්‍රවාහනය උදෙසා බිහිවූ නිර්මාණයක් නම් කරන්න. (ල 4)

iii. කාර්මික විප්ලවය ශ්‍රී ලංකාව කෙරෙහි ඇතිකළ හිතකර හා අහිතකර බලපෑම් එක බැගින් දක්වා විස්තර කරන්න. (ල 5)

iv. කාර්මික විප්ලවය යුරෝපා සමාජය මත ඇති කළ අහිතකර බලපෑම් දෙකක් හා හිතකර බලපෑම් එකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ල 6)